# මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
# மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
# Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: *www.psc.cp.gov.lk*

e-mail: *psc.cp.gov@gmail.com*

| | | | |
|---|---|---|---|
| කාර්යාලය / காரியாலயம் / Office | 081-2213097 | ලේකම් / செயலாளர் / Secretary | 081-2213096 |
| සහකාර ලේකම් / உதவி செயலாளர் / Asst. Secretary | 081-5631321 | ෆැක්ස් / பெக்ஸ் / Fax | 081-2213082 |


මගේ අංකය / எனது இல. / My No. CPC/PSC/28/23/2021

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date 2021.09.

සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබූ රියදුරු මහතුන් වෙත,

**<u>මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරු සේවයේ III ශ්‍රේණියට සීමිත පදනම මත බඳවා ගැනීම 2021 සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය</u>**

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරු III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගයට අයදුම්පත් කැඳවමින් 2021.05.03 දිනැතිව මධ්‍යම පළාත් සභාවේ ආයතන වෙත යොමුකරන ලද අභ්‍යන්තර නිවේදනය මත 2021.07.31 දින පැවති ලිඛිත විභාගයේ ප්‍රතිඵල අනුව ඔබ, සුදුසුකම් පරීක්ෂා කර බැලීමේ සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර, බඳවා ගැනීමේ දැන්වීම ප්‍රකාරව මූලික සුදුසුකම් සපුරා ඇති බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව ප්‍රායෝගික පරීක්ෂණයකට යොමු කිරීමට නියමිත බව දැනුම් දෙමි. එම සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂයේ මුල් අදියර **............... දින පෙ.ව./ප.ව. ........**ට මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී පැවැත්වේ. ප්‍රායෝගික පරීක්ෂණයේ දෙවන අදියර පිළිබඳව මුල් අදියර අවසානයේ දී ඔබ දැනුවත් කරනු ලැබේ.

02. ඒ අනුව **2021.09......** දින පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත්ද, ඒවායේ අමතර ඡායා පිටපත බැගින්ද රැගෙන නියමිත වේලාවට පෙර පැමිණෙන ලෙස කාරුණිකව දන්වමි.(සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන විට මේ සමග ඇති ආකෘති පත්‍රයද සම්පූර්ණ කර රැගෙන ආ යුතුය.) සම්මුඛ පරීක්ෂණය සඳහා නියමිත දිනට අනිවාර්යයෙන්ම සහභාගී විය යුතු අතර ඒ සඳහා වෙනත් දිනයක් ලබා දෙනු නොලැබේ. සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය හෝ/හා ප්‍රායෝගික පරීක්ෂණය සඳහා සහභාගී වීම හේතුවෙන් මධ්‍යම පළාත් මෝටර් රථ රියදුරු සේවයේ ස්ථිර තනතුරක් ලබා ගැනීම සඳහා ඔබ අනිවාර්ය සුදුස්සෙකු බවට පත් නොවන බව හා මෙම සහභාගිත්වය වෙනුවෙන් ගමන් වියදම් හා උපවේශන දීමනා ගෙවනු නොලබන බව වැඩි දුරටත් දැනුම් දෙමි.

I. ඔබගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය.
II. වලංගු රියදුරු බලපත්‍රය
III. උප්පැන්න සහතිකයේ මුල් පිටපත.
IV. පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකය.
V. කලාප අධ්‍යාපන කාර්යාලයෙන් සනාථ කරන ලද ශිෂ්‍යකාර්ය දර්ශකය හෝ විභාග දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනලද අ.පො.ස.( සා.පෙළ) ප්‍රතිඵල ලේඛණය (ඔබගේ මුල් පත්වීමට අදාළ වන අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීමට හැකි වන පරිදි) ප්‍රතිඵල ලේඛණ මෙතෙක් විභාග දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන නොමැති අයැදුම්කරුවන් මාර්ගගත (online) කඩිනමින් ප්‍රතිඵලලේඛන ලබා ගතයුතු අතර ඒ පිළිබඳ තොරතුරු https://certificate.doenets.lk/assets/docs/One_Day_Certificate_Sinhala.pdf සබැඳිය මඟින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් . (link- https;//certificate.doenets.lk) ලබාගත හැක. පාසලේ විදුහල්පති විසින් නිකුත් කරනු ලබන සහතික පිළිගනු නොලැබේ.
VI. වර්තමාන තනතුරේ මුල් පත්වීම් ලිපිය හා පත්වීම ස්ථිර කර ඇති නම් එම ලිපියේ සහතික කල පිටපත
VII. විනය පරීක්ෂණ හෝ විගණන විමසුම් නොමැති බවට හා වැඩ පැමිණීම හා හැසිරීම සතුටුදායක බවට දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය
VIII. දිවා කාලයේ හා රාත්‍රී කාලයේ දී මනා ඇස් පෙනීමකින් යුක්ත බවට රජයේ හෝ පෞද්ගලික (MBBS) වෛද්‍ය වරයෙකු විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතිකයක්
IX. උප්පැන්න සහතිකයේ හෝ අධ්‍යාපන සහතිකවල නමෙහි වෙනසක් පවතී නම්, සාමදාන විනිශ්චයකාරවරයෙකුගේ ඉදිරියේ අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශයක්.

03. රටේ පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සෞඛ්‍ය අංශවල උපදෙස් අනුව මෙම සම්මුඛ පරීක්ෂණ කටයුතු සිදුකෙරෙන බැවින් සම්මුඛ පරීක්ෂණයට සහභාගිවන ඔබ විසින් පහත සඳහන් සෞඛ්‍යාරක්ෂිත පිළිවෙත් අනුගමනය කළයුතු බව අවධාරනය කරමි.

I. මුව ආවරණ පැළඳිය යුතුය. එසේ වුවද ඔබගේ අනන්‍යතාවය තහවුරු කරගන්නා අවස්ථාවලදී පමණක් මුව ආවරණ ඉවත් කර අදාළ නිලධාරීන් වෙත පූර්ණ සහාය දැක්විය යුතුය.
II. අයැදුම්කරුවන් හැර වෙනත් පුද්ගලයින් සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන පරිශ්‍රයට ඇතුළුවීමෙන් වැලකිය යුතුය.
III. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන පරිශ්‍රය තුළ පුද්ගල දුරස්ථභාවය පවත්වා ගත යුතුය.
IV. දෑත් සේදීම හෝ පිරිසිදුකාරක දියර භාවිතාකර සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන පරිශ්‍රයට ඇතුළු විය යුතුය.

ටී.ඒ.ඩී.ඩබ්. දයානන්ද
ලේකම්
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා
කොමිෂන් සභාව